


සංස්කරණය
**අසෝක සිල්වා**



# ශ්‍රී ලංකා ක්‍රිකට් පිටියේ හීන් සැරය

## උපුල් චන්දන සන්නස සමග උණුසුම් කතා බහක

අසෝක සිල්වා

තුන් ඉරියව්වෙන්ම කැපී පෙනෙන ක්‍රීඩකයන් යනු ක්‍රිකට් කණ්ඩායමක ශක්තිය හා ජවය ඉහළ දමන ප්‍රධාන සාධකයක් බව නොරහසකි. එවැනි තුන් ඉරියව්වෙන්ම කැපී පෙනෙන ක්‍රීඩකයන් බොහෝ දෙනෙකුගේ සේවය ශ්‍රී ලංකා කන්ඩායමට පසුගිය කාලයේ අහිමිව ගියේ මන්ද යන්න ගැටලුවකි. පසුගිය දා ශ්‍රී ලංකා කණ්ඩායමෙන් සමුගත් උපුල් චන්දන ද එවැනි ක්‍රීඩකයෙකි. ඔස්ට්‍රේලායාවට එරෙහිව එක් තරගයකදී ඔස්ට්‍රේලියාව තුළ දීම කඩුළු 10 ක ලබා ශ්‍රී ලංකා වාර්තාවක් පිහිට වූ උපුල් චන්දන සන්නස පාඨකයනට අමුතුවෙන් හඳුන්වාදීමේ අවශ්‍යතාවක් නැත. ශ්‍රී ලංකාවට නොවැටුහුණ ද මෙවන් ක්‍රීඩකයන්ගේ අගය ලොව පුරා සිටින සියලුම කණ්ඩායම් වටහාගෙන සිටින මොහොතක සන්නස වෙුනවෙන් උපුල් චන්දන සමග අපි සාකච්ඡා කළෙමු.

**ඔබ ක්‍රිකට් ක්‍රීඩාවෙන් සමුගත්තේ තරමක් වෙනස් ආකාරයකටයි**

ශ්‍රී ලංකා කණ්ඩායමට ක්‍රීඩකයන් තෝරාගන්නා ආකාරය ගැන මට පමණක් නෙවෙයි දක්ෂ ක්‍රීඩකයන් රැසකට තේරුම් ගන්නට නොහැකි යුගයකයි මා ක්‍රීඩාවෙන් සමුගත්තේ. තාමත් තේරීම් කමිටුව ක්‍රීඩකයන් තෝරා ගන්නට අනුගමනය කරන පදනම හෝ ප්‍රමිතීන් මොනවාදැයි කියන

*<u>ජාතික කණ්ඩායමට තේරීමේදී දක්ෂ ක්‍රීඩකයන් 11 දෙනෙකු ක්‍රීඩාංගනයට ගෙන ඒම ක්‍රිකට් බලධාරීන්ගේ වගකීමක්. ඒ සඳහා ඔවුන් ක්‍රීඩකයන්ගේ දක්ෂතා පමණක් අගැයීමට ලක් කළ යුතුයි. ඒසේ නොමැතිව ක්‍රීඩකයන්ගේ දැන හැඳුනුම්කම් අදහන ආගම කතා කරන භාෂාව එහෙමත් නැත්නම් ක්‍රීඩා කරන ක්‍රීඩා සමාජය වැනි දෑ සැළකිල්ලට ගෙන කටයුතු කරනවා නම් ඔවුන් ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩාවට ද්‍රෝහි කම් කරන්නවුන් ලෙසයි මා දකින්නේ.</u>*

ප්‍රශ්නයට සාධාරණ පිළිතුරක් මට සිතා ගැනීමට අපහසුයි. ඒ නිසාම ඒ ගැන හඬක් නංවමින් මා ක්‍රීඩාවෙන් සමුගත්තා. දක්ෂ ක්‍රීඩකයන්ට ශ්‍රී ලංකා කණ්ඩායමේ දොරටු විවෘත විය යුතු යයි යම් හැඟීමක් අපේ ක්‍රිකට් බලධාරීන්ට ඇති වේවායි යන හැඟීමෙන්යි මම ඒසේ කළේ.

**ඔබෙන් පසුව මාවන් අතපත්තු තේරීම් කමිටුව විවේචනය කළේ විහිලු කාරයකු වටා එක්වූ රූකඩ ලෙසයි. මෙවැනි විවේචන මෙයිට පෙර ශ්‍රී ලංකා ක්‍රිකට් පිලේ දකින්ට තිබුණේ නෑ.**

ඒක ඉතාමත් වැදගත් ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නයට දිය හැකි කෙටිම පිළිතුර තේරීම් කමිටුව ඉතිහාසයේ කවදාවත් නැති තරමට පිරිහිලා

*<u>තේරීම් කමිටුව ක්‍රීඩකයන්ගේ දක්ෂතා දැක බලා ගැනීමට තරග නැරඹිය යුතුයි. සීතල කාමර වලට වී පුටු රත් කරමින් මේ වගේ වැදගත් රාජකාරියක් ඉටු කළ හැකි ද?</u>*

කියන එකයි. ජාතික කණ්ඩායමක් නියෝජනය කරන ක්‍රීඩකයන් වශයෙන් ඉතා ප්‍රවේශමෙන් ආදර්ශමත්ව ප්‍රකාශ නිකුත් කිරීම අපේ වගකීමක්. එහෙත් අසාධාරණය රජ කරවමින් කණ්ඩායමට හානියක් වන ආකාරයට කෙනෙක් කටයුතු කරනවා නම් තමන්ට ලැබෙන පෞද්ගලික වාසි නොතකා නැගී සිටීම පරම යුතුකමක් ලෙයසි මා දකින්නේ.



ජාතික කණ්ඩායමට තේරීමේදී දක්ෂ ක්‍රීඩකයන් 11 දෙනෙකු ක්‍රීඩාංගනයට ගෙන ඒම ක්‍රිකට් බලධාරීන්ගේ වගකීමක්. ඒ සඳහා ඔවුන් ක්‍රීඩකයන්ගේ දක්ෂතා පමණක් අගැයීමට ලක් කළ යුතුයි. ඒසේ නොමැතිව ක්‍රීඩකයන්ගේ දැන හැඳුනුම්කම් අදහන ආගම කතා කරන භාෂාව එහෙමත් නැත්නම් ක්‍රීඩා කරන ක්‍රීඩා සමාජය වැනි දෑ සැළකිල්ලට ගෙන කටයුතු කරනවා නම් ඔවුන් ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩාවට ද්‍රෝහි කම් කරන්නවුන් ලෙසයි මා දකින්නේ.

තේරීම් කමිටුව ක්‍රීඩකයන්ගේ දක්ෂතා දැක බලා ගැනීමට තරග නැරඹිය යුතුයි. සීතල කාමර වලට වී පුටු රත් කරමින් මේ වගේ වැදගත් රාජකාරියක් ඉටු කළ හැකි ද? ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ප්‍රධාන තරගමාලාවල දත්ත සහ ක්‍රීඩකයන්ගේ ශාරීරික යෝග්‍යතා මෙන්ම වයස් ප්‍රමාණයන්ද සළකා බලමින් කණ්ඩායම තෝරා ගනු ලබන්නේ නම් ශ්‍රී ලංකාවේ ජයග්‍රහණ ප්‍රතිශතය මෙයට වඩා උසස් මට්ටමකට ගෙන ආ හැකි බව මගේ විශ්වාසයයි.

**ඔබ සිතන ආකාරයට ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කිරීමට කළ යුතු දේ මොනවාද?**

ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩාවේ ශක්තිමත් අත්තිවාරම ලෙස පාසල් ක්‍රිකට් හඳුන්වන්න පුලුවන්. එදා අර්ජුන රණතුංග හා අරවින්ද සිල්වා දුලිප් මෙන්ඩිස් සංජීව වීරසිංහ වැනි ක්‍රීඩකයින් පාසලෙන් කෙළින්ම ජාතික කණ්ඩායමට එක් වූ ක්‍රීඩකයන් ලෙස මගේ මතකයට නැගෙනවා. අද පාසල් ක්‍රිකට් වල තත්වය පිරිහෙමින් පවතිනවා. විසේ ඇති කොල්ලන් හතු වගේ පිපෙන ජාත්‍යන්තර පාසල් වලට ඇතුල් වන නිසා මේ දේ වෙනවා කියලයි මට හිතෙන්නෙ. මේ නිසා ප්‍රධාන කොටම පාසල් ක්‍රිකට් ක්‍රීඩාව නැංවීමට වැඩ පිළිවෙලක් සකස් කළ යුතුයි. එමෙන්ම ක්‍රිකට් ඇකඩමි පළාත් මට්ටමින් පහිටුවා නැගී එන ක්‍රීඩකයන් එමගින් පුහුණු කළ යුතු ම දෙයක් බව මගේ අදහසයි. පිටියේදීත් පිටියෙන් පිටතදීත් මොන තරම් දේ ඉගෙන ගන්නට තිබෙනවාදැයි නවීන ක්‍රිකට් ක්‍රීඩාව දෙස බලා සිටින විට ඕනෑම කෙනෙකුට පෙනෙන සත්‍යයක්.

ඒ ඇරුණාම ඉතාම වැදගත් දෙය ලෙස මා දකින්නේ නිවැරදි ක්‍රිකට් පරිපාලනයක අවශයතාවයි. නිවැරදි එඩිතර ජාතික කණ්ඩායමට හිතකර අවංක දේශපාලනයෙන් තොර ක්‍රීඩා බලධාරීන් ක්‍රිකට් ක්‍රීඩාවේ පෙරමුණ ගත යුතුයි. අර්ජුන රණතුංග ස්ථිරවම එවැනි පුද්ගලයෙකු ලෙස මා දකිනවා. අද ඔස්ට්‍රේලියාව ක්‍රිකට් ජයග්‍රහණ ලබාගන්නේ පිත්තෙන් හා පන්දුවෙන් පමණක් නොවන බව අපි කවුරුත් දන්න දෙයක්. අර්ජුන එදා සිටම අසාධාරණය හමුවේ කොන්ද නොනමා සටන් කළ හැටි ඔබට මතක ඇති. එවැනි පුද්ගලයින්ගේ මග පෙන්වීම ක්‍රිකට් ක්‍රීඩාවට අත්‍යවශ්‍ය දෙයක්.

**ඔබේ ඔස්ට්‍රේලියා සංචාරයේ අරමුණ..?**

නිව් සවුත් වේල්ස් ප්‍රාන්තයේ උතුරු දිස්ත්‍රික්කය වෙනුවෙන් මේ ක්‍රිකට් වාරයේදී ක්‍රීඩා කිරීමට මට ආරාධනා ලැබුණා. ඒ සඳහායි මා ඔස්ට්‍රේලියාවට පැමිණියේ. ඇත්තෙන්ම ශ්‍රී ලංකා කණ්ඩායමෙන් සමුගැනීමෙන් පසු ඉන්දියාව එංගලන්තය ඔස්ට්‍රේලියාව හා දකුණු අප්‍රිකාව ඇතුළු තවත් රටවල් කීපයකින්ම ක්‍රීඩා කිරීම සඳහා මට ආරාධනා ලැබුණා. එහෙත් දරුවන් දෙදෙනා හා බිරිඳ සමග විවේකයක් ගත කරමින් ක්‍රීඩාවේත් යෙදෙන්න පහසු වන්නයි මෙම ක්‍රිකට් වාරයේදී ඔස්ට්‍රේලියාවට එන්න තීරණය කළේ.

**ළඟ එන තුන්කොන් ක්‍රිකට් තරගාවලිය ගැන ඔබේ අදහස කුමක් ද?**

ලොකයේ තිබෙන ප්‍රබලම එක් දින කණ්ඩායම් තුනක් තරග වදින මෙම තරගාවලිය ඉතාමත්ම තරගකාරී මුහුණුවරක් ගන්නා බවට සැකයක් නැහැ. නමුත් ඉතා හොඳ පෙර සූදානමකින් තරගාවලියට පිවිසුණොත් එයින් ජයගන්න අපට ශක්තිය ඇති බව මගේ විශ්වාසයයි. ලොකයේ හොඳම පන්දු යවන්නාත් පිතිකරුවාත් අපේ කණ්ඩායම සතුයි. ක්‍රීඩා බලධාරීන් වගකීමෙන් හා අවංකව කණ්ඩායම තේරීම හා අනෙකුත් දේ සැළසුම් සහගතව කළ යුතු බව නැවතත් අවධාරණය කරන්න මම කැමතියි.

**ඔබේ අනාගත බලාපොරොත්තු මොනවාද?**

තව වසර කීපයක් ක්‍රිකට් ක්‍රීඩාවේ යෙදන්න බලාපොරොත්තු වෙනවා. ඒව ගේම ක්‍රිකට් ක්‍රීඩාවෙන් ලබා ගත් අත්දැකීම් හා දැනුම උපයෝගී කරගෙන කළ හැකි යමක් ඇත්නම් එය අවංකව කිරීමට බලාපොරොත්තු වෙනවා.

## Sri Lanka squad for the CB Series in Australia

Mahela Jayawardene (capt), Kumar Sangakkara, Sanath Jayasuriya, Upul Tharanga, Dilruwan Perera, Tillakaratne Dilshan, Chamara Silva, Chamara Kapugedera, Chanaka Welegedara, Chaminda Vaas, Lasith Malinga, Nuwan Kulasekera, Muttiah Muralitharan, Farveez Maharoof, Ishara Amerasinghe

## SL in Australia ODI Shedule

Fixtures

Commonwealth Bank Series, 2007/08

### February 2008

Sun 3 - **1st Match** - Australia v India
Brisbane Cricket Ground
Tue 5 -**2nd Match** - India v Sri Lanka
Brisbane Cricket Ground
Fri 8 - **3rd Match** - Australia v Sri Lanka
Sydney Cricket Ground
Sun 10 - **4th Match** - Australia v India
Melbourne Cricket Ground
Tue 12 - **5th Match** - India v Sri Lanka
Manuka Oval, Canberra
Fri 15 - **6th Match** - Australia v Sri Lanka
W.A.C.A. Ground, Perth
Sun 17 - **7th Match** - Australia v India
Adelaide Oval
Tue 19 - **8th Match** - India v Sri Lanka
Adelaide Oval
Fri 22 - **9th Match** - Australia v Sri Lanka
Melbourne Cricket Ground
Sun 24 - **10th Match** - Australia v India
Sydney Cricket Ground
Tue 26 - **11th Match** - India v Sri Lanka
Bellerive Oval, Hobart
Fri 29 - **12th Match** - Australia v Sri Lanka
Melbourne Cricket Ground

### March 2008

Sun 2 - **1st Fina**l - TBC v TBC
Sydney Cricket Ground
Tue 4 - **2nd Final** - TBC v TBC
Brisbane Cricket Ground
Fri 7 - **3rd Final** - TBC v TBC
Adelaide Oval (if required)

## මේරියන් ජෝන්ස් හය මසක් සිරගෙට



තහනම් උත්තේජක භාවිතා කිරීම සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටි ඇමරිකානු ජාතික කෙටි දුර ධාවන ශූරී මේරියන්ස් ජෝන්ස් හට එරට අධිකරණය විසින් මාස 6 ක සිර දඬුවමක් නියම කර තිබේ. තහනම් උත්තේජක භාවිතා කිරීම සම්බන්ධයෙන් පැවැති පරීකෂණ වලදී එම පරීකෂණ නොමග යැවීම සඳහා වැරදි දත්ත ලබාදීම සම්බන්ධයෙන් වැරදිකාරීය වීම නිසා ඇයට මෙම මාස 6 ක සිර දඬුවම නියම වී තිබේ. 2000 වසරේ' සිඩ්නි ඔලිම්පික් උළෙලේදී රන් පදක්කම් 3 ක් ඇතුළුව මූළු පදක්කම් 5 ක් දිනා ගත් මේරියන්ස් ජෝන්ස් අදාළ දඬුවම නියම වන විට 32 වැනි වියේ පසුවිය.

ඇය මීටර් 100, මීටර් 200 හා මීටර් 400 සහය දිවීම යන ඉසව් වලින් රන් පදක්කම් 3 ක්ද, දුර පැනීම ඉසව්වෙන් හා මීටර්' 100 සහය දිවීමේ ඉසව්වෙන් ලෝකඩ පදක්කම් 2 ක්ද දිනා ගෙන සිටියාය.

මාස 6 ක සිර දඬුවම ලබා දීමෙන් අනතුරුව මාධ්‍යයට අදහස් දක්වා ඇති මේරියන්ස් ජෝන්ස් පවසා ඇත්තේ, නිව්යෝක් අධිකරණය තමාට ලබා දුන් මෙම දඬුවමට තමා හිස නමන බවත් ඉදිරියට ක්‍රීඩාවේ නියැලෙන්නන් හට මෙයින් හොඳ පාඩමක් ඉගෙන ගත හැකි බවයි.